www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 11 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | 2 ඒකකය |
|---|---|---|

## බුදු ගුණ අනන්තය

## I කොටස

**01. නිවැරදි පිළිතුර ලකුණු කරන්න.**

1. ඉතිපිසෝ පාඨයේ ඇතුළත් බුදුගුණ සංඛ්‍යාත්මකව,
   - i. 08 කි
   - ii. 09 කි
   - iii. 06 කි
   - iv. 05 කි

2. බුදුරජාණන් වහන්සේගේ ගිලානෝපස්ථානය සඳහා උදාහරණයකි.
   - i. සැරියුත් තෙරුන්ට පිහිට වීම
   - ii. වක්කලි තෙරුන්ට පිහිට වීම
   - iii. පූතිගත තිස්ස තෙරුන්ට පිහිට වීම
   - iv. අස්සජි තෙරුන්ට පිහිට වීම

3. බුදුරජාණන් වහන්සේගේ ධර්ම චාරිකා ක්‍රම දෙක ලෙස සැලකෙන්නේ,
   - i. තුරිත චාරිකා, අතුරිත චාරිකා
   - ii. ධම්ම චාරිකා, සදහම් චාරිකා
   - iii. තුරිත චාරිකා, ධම්ම චාරිකා
   - iv. අතුරත චාරිකා, සදහම් චාරිකා

4. බුදුරදුන්ගේ ''පුරිස ධම්ම සාරථී'' ගුණය සඳහා උදාහරණයක් වන්නේ,
   - i. සුනීත හික්මවීම
   - ii. සෝපාක හික්මවීම
   - iii. රාහුල හික්මවීම
   - iv. අංගුලිමාල හික්මවීම

5. බුදුරජාණන් වහන්සේ අසරණයන්ට පිහිට වූ අවස්ථා දෙකක් වන්නේ,
   - i. රජ්ජුමාලාට හා පටාචාරාට පිහිට වීම
   - ii. උපතිස්ස කෝලිත දෙදෙනාට පිහිට වීම
   - iii. චුල්ලපන්ථක මහාපන්ථක දෙපලට පිහිට වීම
   - iv. නන්ද කුමරුට හා රාහුල කුමරුට පිහිට වීම

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk


agaram.lk

## II කොටස

- **සියළු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

02. 1. බුදුරජාණන් වහන්සේ රෝගීන්ට පිහිට වූ අවස්ථා දෙකක් සඳහන් කරන්න.
2. බුදුරදුන්ගේ නායකත්ව ගුණාංග පහක් සඳහන් කරන්න.
3. ''යෝ ගිලානං උපට්ඨේහි සො මං උපට්ඨේ'' යන්නෙහි අර්ථය සඳහන් කරන්න.
4. බුදුරදුන්ගේ ධර්ම චාරිකා ක්‍රම දෙක නම් කරන්න.
5. සුචිරෝම කරරෝම කථා ප්‍රවෘත්තියෙන් බුදුරදුන්ගේ කිනම් බුදු ගුණය ප්‍රකට කෙරේද?
6. අටලෝදහම පිළිවෙලින් නම් කරන්න.
7. තාදී ගුණය යන්නෙහි අදහස ලියන්න.
8. බුදුරදුන් සමානාත්මතාවයෙන් යුතුව ක්‍රියා කළ බවට උදාහරණ දෙකක් සඳහන් කරන්න.
9. බුදුරදුන් දමනය කළ යක්ෂයින් තිදෙනෙක් නම් කරන්න.
10. අසදෘෂ මහා දානය බුදුරදුන්ට පූජා කළේ කවුරුන්ද?

03. 1. මෙම පාඩමේ එන බුදුගුණ හයක් නම් කරන්න.
2. ඉන් එකක් පිළිබඳ කෙටි සටහනක් ලියන්න.
3. ඔබ ගිලන් වූ පවුලේ කිසිවෙකුට හෝ උපස්ථාන කළ අවස්ථාවක් පිළිබඳ පැහැදිලි කරන්න.

04. 1. නොහික්මුණු අය හික්මවන බුදුගුණය සඳහන් කරන්න.
2. බුදුරදුන් නොහික්මුණ අයෙක් දමනය කළ අවස්ථාව කෙටියෙන් සඳහන් කරන්න.
3. අපට ද සමාජයේදී විෂම විවිධ පුද්ගලයන් ඇසුරට ලැබේ. එවිට එම පුද්ගලයන් සමඟ හික්මීමෙන් ක්‍රියා කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!